# විජාතික බලවේග හා බණ්ඩාරනායකලා

තමන් හා මහින්ද රාජපක්ෂ මහතා අතර කිසිම ආරවුලක් නැතැයි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඉඳහිට ප්‍රකාශකළ ද, අද ශ්‍රී ල නි පක්ෂයේ ඇයත් ඇයට සමීප කිහිපදෙනකුත් පක්ෂයේ අනෙක් වැඩිපිරිස සමග අරගලයක යෙදී ඇති බව පැහැදිලි ය. මේ අරගලය අන් කිසිවක් නොව ජාතික හා විජාතික බලවේග අතර ඇති අරගලයකි. මුළු රටේ ම ඇති මේ අරගලය ජනාධිපතිවරණය ඔස්සේ විවිධ පැතිවලින් කරළියට පැමිණ ඇත. මහින්ද රාජපක්ෂ මහතා ජාතික බලවේගවලට නායකත්වය දෙන අතර රනිල් වික්‍රමසිංහ මහතා වෙනත් අයකුගේ නායකත්වය යටතේ විජාතික බලවේගවල නියෝජිතයා ලෙස තරගයට ඉදිරිපත් වී ඇත. විජාතික බලවේගවල නායකයා පෙනෙන්නට නැත. ඔහු ඇතැම්විට ලංඩනයේ, වොෂිංටනයේ, ඔස්ලෝහි හෝ වෙනත් තැනක සියල්ල මෙහෙයවනවා විය හැකි ය. ඒ නායකයා කවුදැයි දැනගැනීමේ අවශ්‍යතාවක් ද අපට නැත. අප දන්නා කරුණක් ඇත. විජාතික බලවේග ක්‍රියාකරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ න්‍යාය පත්‍රයට අනුව ය. ඒ න්‍යාය පත්‍රයෙහි ප්‍රධානම කරුණ වනුයේ ලෝකයම යුදෙව් ග්‍රීක චින්තනයටත් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියටත් ගැනීම ය. හැකිනම් ලෝකයම ආගමෙන් ක්‍රිස්තියානි කිරීම ය.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද අයත්වන්නේ විජාතික බලවේගයට ය. මහින්ද රාජපක්ෂ මහතාට අවාසනාවකට මෙන් විජාතික බලවේග සමග කරන මුල්ම සටන ශ්‍රි ල නි පක්ෂයෙහි නායිකාව හා ඇගේ සොහොයුරා වූ අනුර බණ්ඩාරනායක මහතා සමග කිරීමට සිදු වී ඇත. එහෙත් එය එතරම් අමාරු සටනක් විය නො හැකි ය. ශ්‍රි ල නි පක්ෂයෙහි විජාතික බලවේගය අද ඉතා දුර්වල වී ඇත. නියෝජ්‍ය ඇමතිවරු ඇටිකිච්චන් කිහිප දෙනකු හැරෙන්නට එහි වෙනත් බලයක් නොමැත. කුමාරතුංග මහත්මිය මුලින් ම ශ්‍රී ල නි පක්ෂයෙහි සිටියදීම තම මස්සිනා විසින් පිහිටුවන ලද ජනවේග කල්ලියට ආධාර කළා ය. ජනවේග කල්ලියට මූලික වශයෙන් අවශ්‍ය වූයේ බොරු සමාජවාදයක සිටින බව හඟවමින් ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස්කිරීම ය. ජාතිකත්වයේ හෙවත් සිංහලත්වයේ පක්ෂය වූ ශ්‍රී ල නි පක්ෂය විජාතිකත්වයේ පක්ෂයක් බවට පත්කිරීම ඊනියා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරිකයකු වූ කුමාර රූපසිංහ මහතාට එකල ලැබී තිබුණු කොන්ත්‍රාත්තුව විය. ඉන් පසුව කුමාරතුංග මහත්මිය  මහජන පක්ෂයට එකතු වූවා ය. ඉන්පසු ඇය නැවතුණේ බහුජන නිදහස් පක්ෂයෙහි ය. මේ පක්ෂය අද ක්‍රියාකාරී දැයි අපි නො දනිමු. ඒ කෙසේ වෙතත් ඒ පක්ෂයත් මහජන පක්ෂයත් ජාතිකත්වයට විරුද්ධ පක්ෂ ලෙස හැඳින්විය හැකි ය.

1956 න් පසුව ශ්‍රි ල නි පක්ෂය, වෙනත් පක්ෂවල ද සහාය ඇතිව කිහිප වතාවක් ම රට පාලනය කර ඇත. එහෙත් 1977 පරාජයෙන් පසු දීර්ඝ කාලයක් විපක්ෂයේ සිටීමට ඒ පක්ෂයට සිදුවිය. මහින්ද රාජපක්ෂ මහතා සහ වෙනත් අය 1992 වන විට පාද යාත්‍රා හා වෙනත් උද්ඝෝෂණ ඔස්සේ පක්ෂය බලයට පැමිණීමේ එළිපත්තට ගෙනැවිත් තිබුණහ. විජාතික බලවේග ක්‍රියාත්මක වූයේ මෙවිට ය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය එංගලන්තයෙන් මෙරටට ආනනය කරනු ලැබිණි. ඇය පළමුව පොදු පෙරමුණේ ද පසුව ශ්‍රී ල නි පක්ෂයේ ද නායිකාව බවට හීන් සීරුවේ ම පත්කරනු ලැබිණි. එසේ විජාතික බලවේගවල ආධාරයෙන් නායිකාව බවට පත්වූ කුමාරතුංග මහත්මිය සම්මේලනයක් හෝ නොපවත්වා තම හිතුමතයට ශ්‍රි ල නි පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස් කළා ය. ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්තිය වූයේ ඒකීය රාජ්‍යය. බුදු දහමට ප්‍රධාන තැන  දීම ය. සිංහලය රාජ්‍ය භාෂාව කිරීම ය. කුමාරතුංග මහත්මිය ඒ සියල්ල වෙනස් කෙළේ පක්ෂයෙන් අසා නොවේ. ඇය විජාතික බලවේගවලට අවශ්‍ය පරිදි ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස් කළා ය. බණ්ඩාරනායකවරුන්ගේ ආණ්ඩු සිංහලයන්ට, සිංහල භාෂාවට හා සිංහල සංස්කෘතියට හිමිවිය යුතු තැන හිමිකරදීම සඳහා ක්‍රමයෙන් කටයුතු කළ ද කුමාරතුංග මහත්මිය ඒ සියල්ල කණපිට හැරවූවා ය. ඇය තම දෙමව්පියන්ගේ ප්‍රතිපත්ති විවේචනය කළා ය. සියල්ලට වරදකරුවා සිංහලයා බව ඇගේ මතය විය. දෙමළ ජනතාවගේ දුක්ගැනවිලිවලට විසඳුම් දීමට තැත්කළ සෑවිටකම සිංහල අන්තවාදීන් එයට විරුද්ධ වූ බව ඇය පැවසුවා ය. ඒ අතර සාමය විකුණුවා ය. අපි යුදවාදී හෝ යුදවිරෝධී හෝ  නොවෙමු. අවශ්‍යතාවක් ඇතිවිට යුදකළ යුතු ය. ඒ සඳහා හමුදා සූදානම් කළයුතු ය. වැසිකිලිවාදීන් හෝ වැසිකිලිවිරෝධීන් හෝ සිටින්නේදැයි නො දනිමු. අවශ්‍ය වූ විට මිනිස්සු ඒ කාර්යය කරති. වැසිකිලිවිරෝධය නිසා ඒ කාර්යය නොකරන්නන්ට ඉස්මුරුතාව හැදීමට ඉඩ ඇත. යුදවිරෝධය නිසා අවශ්‍ය වූ විට ද යුද්ධ නොකිරීමෙන් හා ඊනියා සාමයක් වෙනුවෙන් හමුදාව දුර්වල කිරීමෙන් අවසානයේ දී බොරු සාමය හරහා කොටි ඉල්ලන සියල්ල, එනම් ඊලම දීමට සිදුවනු ඇත. එවිට ඉස්මුරුතය රටට ය.

© Prof. Nalin De Silva

සිංහලයන්ට පරිභව කිරීමේ දී කුමාරතුංග මහත්මියට වෙනත් විජාතික බලවේගවල සහාය ද ලැබිණි. අද ලෝකයේ අධිපති මතවාද සියල්ලක් ම නිෂ්පාදනය කෙරෙන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය. කලාව, සාහිත්‍යය, විද්‍යාව ආදී මේ සියල්ලක ම දැනුම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික චින්තනයෙහි පදනම් වෙයි. චින්තනය යන සංකල්පය පසුගිය වසර විස්සක පමණ කාලයෙහි වර්ධනය වී ඇත. එය ගුණදාස අමරසේකර මහතා පළමුවෙන් යොදාගත්තේ ඉංගිරිසියෙන් තෝට් යනුවෙන් ඇති වචනයෙහි පරිවර්තනය ලෙස ය. එහෙත් අද චින්තනය යන්න ඒ අරුතින් යොදා නො ගැනෙයි. එය කුන් පඬිවරයා ඉදිරිපත්කළ සුසමාදර්ශය (පැරඩයිම) ට වඩා ගැඹුරු අර්ථයකින් අද යොදා ගැනෙයි. ජාතියක හෝ ජනවර්ගයක හෝ කලා ශිල්ප, ශාස්ත්‍ර, විද්‍යා ආදිය පමණක් නොව ආහාර, ආකල්ප ආදී සියල්ල එකට බැඳ තබන භූය චින්තනය ය. දැනුම් නිර්මානය වන්නේ චින්තනයෙහි ය. වත්මන් ලෝකයෙහි අධිපති චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය වන අතර අධිපති සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙයි. මේ ආධිපත්‍යය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සමග බැඳෙයි. බටහිර නූතනත්වයේ ප්‍රධාන ම අරමුණක් වනුයේ මුළු ලෝකයට ම එකම චින්තනයක් හා සංස්කෘතියක් ලබාදීම ය. එහි දී ලෝකයේ අනෙක් චින්තන හා සංස්කෘති නැතිකිරීමට දුර්වල කිරීමට කටයුතු කෙරෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ මේ න්‍යාය පත්‍රය ලංකාවේ දී ක්‍රියාත්මක වන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය හා සිංහලත්වය නැසීමට ය. එහි දී බටහිරයන් ම විසින් ඇතිකෙරී පෝෂණයකෙරුණු දෙමළ ජාතිවාදය ද යොදා ගැනෙයි. මෙරට ප්‍රශ්නය සිංහලයන්ට හා සිංහල සංස්කෘතියට මෙරට හිමිවිය යුතු තැන අහිමිකිරීම බවට පත්වී ඇත්තේ මේ සංදර්භයෙහි ය. තනිතට්ට, සුදු කළු අළු, සුළඟ එනු පිණිස හෝ එවැනි නමින් නිපදවෙන කසිකබල් කෘතිවලට ඊනියා ජාත්‍යන්තර තෑගි ලැබෙන්නේ ඒ චිත්‍රපටිවලින් සිංහලයා, සිංහල සංස්කෘතිය, හමුදාව ආදියට පරිභව කෙරෙන බැවින් ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් තම අවශ්‍යතාව පරිදි නිපදවෙන කෘතිවලට තෑගි පිරිනැමෙයි. මා මේ චිත්‍රපටි නො බැලුව ද ඒ ඊනියා කලාකෘතිවලින් කෙරෙන කාර්යය හා එවාට තෑගි පිරිනැමෙන ආකාරය පිළිබඳ අවබෝධයක් ඇත. ඒ අවබෝධය අප විසින් ගොඩනගනු ලැබ ඇති දැනුම මත පදනම් වෙයි. ඒ සෛද්ධාන්තික දැනුමක් වෙයි. සෛද්ධාන්තික දැනුම් පිළිබඳ අවබෝධයක් නොමැත්තන් මෙහි දී කලබල වී තම නොදැනුම හඬගා ප්‍රකාශ නොකළ යුතු ය. චිත්‍රපටි නොබලා ම අප සෛද්ධාන්තික ව එළඹෙන නිගමන රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා ආදීන් අතින් ප්‍රායෝගික ව තහවුරු වීමෙන් අප ගොඩනගා ඇති සෛද්ධාන්තික දැනුම තව තවත් ශක්තිමත් වෙයි.

සිංහලයන්ට පරිභවකිරීමේ දී කුමාරතුංග මහත්මියට මේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ කුලීකාරයන්ගේ මෙන් ම ඊනියා රාජ්‍ය නොවන සංවිධානවල අගුටු මිටු බුද්ධිමතුන්ගේ ද සහාය ලැබෙයි. රාජ්‍ය නොවන සංවිධාන යනු බටහිර ක්‍රිස්තියානි රටවල රාජ්‍ය දේශපාලන පක්ෂ, ආදිය මගින් නඩත්තු කෙරෙන ආයතන වෙයි. කුමාරතුංග මහත්මිය සිංහලයන්ට එසේ පරිභව කරන අතර ම ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස්කිරීමක් ගැන මහින්ද රාජපක්ෂ මහතාට දොස් පවරයි. අලි මදිවාට හරක් යැයි කීවාක් මෙන් අනුර බණ්ඩාරනායක මහතා කියන්නේ ශ්‍රී ල නි ප ප්‍රතිපත්ති ගැන තීරණයක් ගතහැක්කේ බණ්ඩාරනායකලාට බව ය. මෙහි දී ප්‍රශ්නයක් පැන නැගෙයි. එනම් බණ්ඩාරනායකලා යනු කවුද යන්න ය. යමකු බ්‍රාහ්මණයකු වන්නේ උපතින් නොව ක්‍රියාවෙන් යැයි බුදුන් වහන්සේ දෙසූහ. සිංහල බෞද්ධ සංස්කෘතියක අපට ඒ අනුව කිවහැක්කේ යමකු බණ්ඩාරනායක කෙනකු වන්නේ උත්පත්තියෙන් නොව ක්‍රියාවෙන් බව ය. මෙහි දී ක්‍රියාව යනු බණ්ඩාරනායක මහතාගේ හා මැතිණියගේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑම ය. කලින් සඳහන් කළ බණ්ඩාරනායක ප්‍රතිපත්ති වෙනුවෙන් අද පෙනී සිටින්නෙන් කවු ද? උපතින් බණ්ඩාරනායකවරුන් වුවත් ක්‍රියාවෙන් බණ්ඩාරනායක නොවන අය ද, නැත්නම් වෙනත් අය ද? කුමාරතුංග මහත්මිය ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී නොසිටිනවා පමණක් නොව එවැනි ප්‍රතිපත්ති අනුගමනය කළ තම දෙමව්පියන් ද විවේචනය කරයි. තම දෙමව්පියන්ගේ ප්‍රතිපත්ති විවේචනයකරමින් දෙමව්පිය උරුමයක් ගැන කතාකරන්නේ කෙසේ ද? කුමාරතුංග මහත්මිය ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්තිවලට දොස්කියා ඒ ප්‍රතිපත්ති වෙනස්කර විජාතික බලවේගවල අවශ්‍යතා අනුව සිංහල විරෝධී ස්ථාවරයක් ගත්තා ය. පක්ෂයක් යනු ප්‍රතිපත්ති මාලාවකි. කුමාරතුංග මහත්මිය ශ්‍රී ල නි පක්ෂයේ මුල් ප්‍රතිපත්ති හිතුවක්කාරී ලෙස වෙනස්කලා පමණක් නොව ඒ වෙනුවට බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියට අවශ්‍යවන පරිදි සිංහල විරෝධී ප්‍රතිපත්ති අනුගමනය කලා ය. මහින්ද රාජපක්ෂ මහතා උත්සාහ කරමින් සිටින්නේ පක්ෂයේ ප්‍රතිපත්ති කලින් තිබුණු තැනට ගැනීම ට ය. බණ්ඩාරනායකලා යනු උපතින් බණ්ඩාරනායක වූවන් නොව ක්‍රියාවෙන් ප්‍රතිපත්තියෙන් බණ්ඩාරනායකලා වූවෝ වෙති. බණ්ඩාරනායකලා යනු විජාතික බලවේගවල අවශ්‍යතාව පරිදි බණ්ඩාරනායක ප්‍රතිපත්තිවලට පහර ගසන්නන් නොව ඒ ප්‍රතිපත්ති ඉදිරියට ගෙනයන්නෝ ය. රාජපක්ෂ මහතා ඒ අරුතින් අද බණ්ඩාරනායක පුත්‍රයෙක් ද, පණස්හයේ දරුවෙක් ද වෙයි.

© Prof. Nalin De Silva